ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

## ඉන්දීය මැතිවරණ කොමිසම විසින් පවත්වනු ලබන ජාත්‍යන්තර මැතිවරණ නරඹන්නන්ගේ වැඩසටහන (IEVP) සඳහා ශ්‍රී ලංකා නියෝජිත පිරිසක්

ඉන්දීය මැතිවරණ කොමිසම මේ දිනවල පැවැත්වෙන ලෝක් සභා මැතිවරණය අතරතුර ජාත්‍යන්තර මැතිවරණ නරඹන්නන්ගේ වැඩසටහන (IEVP) 2024 මැයි 4 සිට මැයි 9 වන දින දක්වා සංවිධානය කර තිබේ. මෙම වැඩසටහන සඳහා ශ්‍රී ලංකාවෙන් ද දස සාමාජික නියෝජිත පිරිසක් සහභාගී වන අතර ඒ සඳහා ශ්‍රී ලංකා මැතිවරණ කොමිසමේ නියෝජිතයන් දෙදෙනෙකු සහ මැතිවරණ නීති සංශෝධනය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට පත් කළ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව නියෝජනය කරමින් අට දෙනෙකු ද ඇතුළත් වනු ඇත.

2. IEVP ඉන්දියාවේ මැතිවරණ පද්ධතියේ ශක්තිමත්භාවය සහ ලෝකයේ විශාලතම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයේ භාවිතා කරන මනා පිළිවෙත් පිළිබඳව දැන ගැනීම සඳහා මැතිවරණ ක්ෂේත්‍රය තුළ කටයුතු කරන ජාත්‍යන්තර මැතිවරණ කළමනාකරණ ආයතන සහ සංවිධාන සඳහා වේදිකාවක් ලෙස කටයුතු කරයි. ඉන්දීය මැතිවරණ කොමිසම 2014 සහ 2019 වසර වලදී පැවති ලෝක් සභා මැතිවරණයන්හිදී ද මෙවන් වැඩසටහන් සංවිධානය කළ අතර ඒවායේ අරමුණ වූයේ විදේශ මැතිවරණ කළමනාකරණ ආයතන සහ ජාත්‍යන්තර සංවිධාන සඳහා ඉන්දියාවේ මැතිවරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා දීමයි.

3. ඉන්දියාවේ මැතිවරණ, EVM සහ VVPAT සහ තොරතුරු තාක්ෂණ මුලපිරීම් සහ මාධ්‍ය සහ සමාජ මාධ්‍ය වපසරිය පිළිබඳ අදහසක් ලබා

දීම වැනි මාතෘකා රැසක් ආවරණය කරමින් විවිධ දැනුවත් කිරීමේ සැසි මෙම වැසඩහටහනට ඇතුළත් වේ. මෙයට අමතරව, සහභාගීවන්නන්ට මැතිවරණ ක්‍රියාවලීන් නිරීක්ෂණය කිරීම සහ විවිධ ඡන්ද මධ්‍යස්ථානවල ඡන්ද ප්‍රකාශ කිරීම දැකබලා ගැනීම සඳහා කණ්ඩායම් වශයෙන් ඉන්දියාවේ විවිධ ප්‍රාන්තවල සංචාරය කිරීමට ද අවස්ථාව හිමි වනු ඇත.

4. මෙම වසරේදී, ඉන්දීය මැතිවරණ කොමිසම 2024 IEVP වැඩසටහන සඳහා මැතිවරණ කළමනාකරණ ආයතන 55ක් සඳහා ආරාධනා කර තිබේ. මැතිවරණ ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීමට සහ ඒ සඳහා සම්බන්ධ විවිධ පාර්ශවකරුවන් සමඟ අන්තර්ක්‍රියා කිරීමට සුවිශේෂි අවස්ථාවක් මෙම වැඩසටහන මගින් ලබාදෙන අතර ඒ හරහා මැතිවරණ කළමනාකරණ ක්ෂේත්‍රය තුළ වඩා ඉහළ අවබෝධයක් සහ සහයෝගීතාවයක් ප්‍රවර්ධනය කරයි.

5. ශ්‍රී ලංකා නියෝජිත පිරිසේ සහභාගීත්වය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශවික බැඳීම් ශක්තිමත් කිරීමට සහ මැතිවරණ පාලනය සම්බන්ධයෙන් දැනුම සහ අත්දැකීම් බෙදාහදා ගැනීමට වන කැපවීම අවධාරණය කරයි. IEVP වැනි මුලපිරීම් හරහා දෙරටම කලාපීය සහ ගෝලීය ප්‍රජාතාන්ත්‍රික ප්‍රතිපත්තීන් සහ පිළිවෙත් ඉහළ නැංවීමට දායකත්වය ලබා දෙමින් සිය මැතිවරණ ක්‍රියාවලීන් තුළ පාරදෘශ්‍යභාවය, අවංකත්වය සහ අන්තර්ග්‍රහණීයත්වය ප්‍රවර්ධනය කිරීමට අරමුණු කරයි.

***

කොළඹ
2024 මැයි 4